**ශීර්ෂය 119 - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේදයේ අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1.1 විගණන විෂය පථය

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 අගෝස්තු 13 දින ආමාත්‍යාංශයේ ලේකම් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.** **ගිණුම්**

**2.1** **විසර්ජන ගිණුම**

**(අ)** **මුළු ප්‍රතිපාදනය හා වියදම**

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 32,311.41 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 24,286.79 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 8,024.62 ක් හෙවත් සියයට 24.84 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 183.90 | 179.98 | 3.92 | 2.13 |
| මූලධන | 32,127.51 | 24,106.81 | 8,020.70 | 24.97 |
| එකතුව | **32,311.41** | **24,286.79** | **8,024.62** | 24.84 |

**2.2** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 11901 | 4.50 | 3.33 | 2.30 | 3.37 | 17.50 | 9.789 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

**----------------------**

අංක 6000/0000/000/0015/0032/000 දරන අමාත්‍යාංශයේ තැන්පත් ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට හර ශේෂය රු.97,545 ක් විය.

**2.4 අග්‍රිම ගිණුම**

**--------------**

2014 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අංක 7002/0000/00/0038/0014/000 දරන අග්‍රිම ගිණුම් ශේෂය රු.22,179,960 ක් වී තිබුණි.

**2.5 විගණන නිරීක්ෂණය**

**----------------------**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරික්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරික්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂය 119 - විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය**

**--------------------------------------------------------**

**3.1 විසර්ජන ගිණුම**

**-----------------**

**අයවැය විචලනය**

**--------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 09 ක් සඳහා සළසා තිබුණු රු. මිලියන 12,230.70 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 36 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ වැය විෂයයන් 3 ක සඳහා සළසා තිබුණු මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර, එම වැය විෂයයන් වෙනුවෙන් 2014 වර්ෂයේදී සළසා ගත් රු.මිලියන 411.5 ක ප්‍රතිපාදනයම මුළුමනින්ම ඉතිරි කර තිබුණි.

**3.2. අග්‍රිම ගිණුම්**

**--------------**

මේ සම්බන්ධයෙන් පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් 19 කට අවස්ථා 102 ක දී එකතුව රු 6,326,321 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කළ යුත් වුවත්, අවස්ථා 23 කට අදාළව ලබා දි තිබුණු එකතුව රු.1,283,957 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම නිරවුල් කිරීම සඳහා අදාල කාර්යය නිමවී මාස 1 ක සිට මාස 7 ක් අතර කාල පරාසයක් ප්‍රමාද කර තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරක දී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිම රු.20,000 ක් වුවත්, එම රෙගුලාසිවලට පටහැනිව අවස්ථා 24 ක දී නිලධාරීන් 7 ක් වෙත රු.20,000 ක් ඉක්ම වූ එකතුව රු.25,832,452 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

## 3.3. විදේශාධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂය සඳහා විදේශ මුල්‍යනය යටතේ ව්‍යාපෘති 27 ක් ක්‍රියාත්මක කිරීමට විසර්ජන පනතින් අමාත්‍යාංශය වෙත රු.21,615,470,000 ක ප්‍රතිපාදන සළසා තිබූ නමුත් ඉන් රු.14,444,161,057 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී උපයෝජනය කර තිබුණි. එම ව්‍යාපෘති අතරින් ව්‍යාපෘති 03 ක් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) තිරසාර බලශක්ති අං ශයේ සහායක ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘතිය යටතේ පොළව හාරණ උපකරණයක් (Digger Derrick) හා පෝර්ක් ලිෆ්ට් 02 ක් (pork lift) මිලදී ගැනීමේදී වරායේ ප්‍රමාද ගාස්තු ලෙස රු.1,778,246 ක් ගෙවා තිබුණි.

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා වූ 2014 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයාට 2015 මාර්තු 31 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවත්, එම මූල්‍ය ප්‍රකාශන මාස 3 ක ප්‍රමාදයකින් පසුව 2015 ජුලී 02 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(iii) 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කාලයෙන් හරි අඩක් අවසාන වී තිබුණද, එම ව්‍යාපෘතිය සඳහා වූ ඇස්තමේන්තුගත පිරිවැයෙන් සියයට 1.2 ක පමණ කාර්යයන් පමණක් ඉටු කර තිබුණි.

(iv) ව්‍යාපෘතියේ නව ගාල්ල විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධන සංරචකය යටතේ ගාල්ල ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම හා අම්බලන්ගොඩ සිට ගාල්ල දක්වා සම්ප්‍රේෂණ රැහැන ඉදිකිරීම් පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 75 ක ප්‍රමාණයක් ඉක්මවා නිම කළ බව වාර්තා කර තිබුණි. කෙසේ වුවද උතුරු නැගෙනහිර විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කිරිබත්කුඹුර ග්‍රිඩ් උපපොළ වැඩිදියුණු කිරීමේ කටයුතු හා ඌව පළාතේ බෙදාහැරීමේ පද්ධතිය ශක්තිමත් කිරීම යටතේ හල්දුම්මුල්ල හා රාගල මධ්‍යම වොල්ටීයතා බෙදාහැරීම් පද්ධතිය සවිකිරීමේ කටයුතු 2014 දෙසැම්බර් 31 දින වන විට මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි. තවද " රිඇක්ටිව් පවර් මැනේජ්මන්ට් " (Reactive Power Management) සංරචකය යටතේ අනියකන්ද, අම්බලන්ගොඩ හා කටුනායක ග්‍රිඩ් උපපොළෙහි පාඩු අවම කිරීම සඳහා "MV breaker switched capacitor banks" සවිකිරීම සඳහා ප්‍රසම්පාදනයන් සමාලෝචිත වර්ෂය තුළ සම්පූර්ණ කර නොතිබුණි. ඊට අමතරව, නැගෙනහිර පළාතේ බෙදාහැරීම් ධාරිතා සංවර්ධනය පිළිබඳ සංරචකය යටතේ සපයන ලද මෝටර් වාහන 03 ක් ව්‍යාපෘතිය විසින් පසුව ප්‍රතික්ෂේප කර තිබූ අතර එම වාහන පිරිවිතරයන් සමඟ ගැලපී නොතිබුණි.

(v) ලංකා විදුලිබල මණ්ඩලය භාරගන්නා ලද සියලු විදේශ මූල්‍යයන ව්‍යාපෘති සඳහා වගකීම් දරන ලංකා විදුලිබල මණ්ඩලයේ අතිරේක සාමාන්‍යාධිකාරීගේ (ව්‍යාපෘති) විෂය පථය යටතට ව්‍යාපෘතියේ 7 සහ 8 කොටස් ඇතුළත් වී නොතිබුණි. එබැවින් ලංකා විදුලිබල මණ්ඩලයට පවරන ලද කොටස් 8 ක කාර්යයන් පිළිබඳ සමස්ත නියාමනය විධිමත්ව සිදුකර නොතිබුණි.

(vi) ආනයනය කරන ලද මෝටර් වාහන සඳහා රු.මිලියන 2.05 ක් වූ අත්තිකාරම්වලින් සියයට 10 ක් හා රු.මිලියන 8.19 ක් වූ රේගු ගාස්තු කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර නොතිබූ අතර ඒවා පිරිවිතරයන්ට අනුකූල නොවූ බැවින් පසුව ප්‍රතික්ෂේප කර තිබුණි.

(ආ) **පිවිතුරු බලශක්ති සහ ජාල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) හෝමාගම සහ අඹගමුව කෝරලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට පාදුක්ක හා පොල්පිටියේ ග්‍රිඩ් විදුලි උපපොලවල් ඉදිකිරීම සඳහා ඉඩම් කොටස් දෙකක් අත්පත් කර ගැනීමට ලබාදෙන ලද රු.මිලියන 25.44 ක තැන්පතුව කෙරීගෙන යන වැඩ යටතේ පෙන්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකුවේ වියපැහැදම් රු.මිලියන 388.30 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල රු.මිලියන 212.73 ක් ලෙස පෙන්වා තිබුණි. එම වෙනස පිළිබඳව විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ මිනුම් පිරිවැය වූ රු.මිලියන 3.29 ක් ඉඩම් යටතේ ප්‍රාග්ධනිත කිරීම වෙනුවට විවිධ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(iv) 2015 මාර්තු 31 දින වන විට විගණනයට ඉදිරිපත් කළ යුතු ව්‍යාපෘතියේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන 2015 ජුනි 18 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

(v) ලංකා විදුලිබල මණ්ඩලය විසින් කොටස් 06 ක් යටතේ එහි අරමුණු වන සම්පූර්ණ යටිතල පහසුකම් බෙදාහැරීම ශක්තිමත් කිරීම හා ජාල කාර්යක්ෂමතාවය හා බෙදාහැරීම වැඩිදියුණු කිරීම උදෙසා ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කර තිබුණි. මන්නාරම, පොල්පිටිය, පාදුක්ක, සහ කැගල්ලේ ග්‍රිඩ් විදුලි උපපොළවල් ඉදිකිරීම හා සවිකිරීමද, බියගම, කොලොන්නාව හා සපුගස්කන්ද බැංකුවල බ්රේක ස්විච් කැපසිටර්ස් (breaker switch capacitors) සවිකිරීමද, කැබිතිගොල්ලැව, කහටගස්දිගිලිය, ගලහ හා අක්කරපත්තුව කුලුනු ඉදිකිරීම හා සවිකිරීමද ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වී තිබුණි. කෙසේ වෙතත් සියළුම කොටස්වල ප්‍රධාන කාර්යයන් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර නොතිබුණි.

ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

- ව්‍යාපෘතියේ පළමු කොටසේ ලොට් ඒ යටතේ මන්නාරම් ග්රිඩ් විදුලි උපපොළවල් ඉඩම් මැනුම් කාර්යය සහ එම කොටසේම ලොට් බී යටතේ සම්ප්‍රේෂණ මාර්ග මිනුම්කරණය වර්ෂ 1 ½ ක ප්‍රමාදයකින් පසුව 2015 මාර්තු මාසයේදී ආරම්භ කර තිබුණි.

- ඉඩම් අත්පත් කරගැනීමේ හා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය නිසා ව්‍යාපෘතියේ දෙවැනි කොටස යටතේ වූ සම්ප්‍රේෂණ හා බෙදාහැරීමේ ජාල කාර්යයක්ෂමතාව වැඩිදියුණු කිරීමට අදාල සියළුම කාර්යයන්හි මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණි.
- සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ 3 වන කොටස යටතේ වූ පාදුක්ක විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධනය සහ 4 වන කොටස යටතේ වූ කෑගල්ල විදුලිබල සම්ප්‍රේෂණ සංවර්ධන කටයුතු මූලික අදියරේ එනම් ඉදිකිරීම් වැඩ හා සම්ප්‍රේෂණ කටයුතු සඳහා ඉඩම් මිනුම්කරමින් පැවතුණි.

**(vi)** ව්‍යාපෘතියේ සෘජු වගකීම ලංකා විදුලි බල මණ්ඩලය වෙත තනි ඒකකයක් ලෙස මුළුමනින්ම පවරා නොතිබුණු බැවින් කාලානුරූපීව මූල්‍ය හා භෞතික ප්‍රගතිය ඇගැයීම් හා සුදුසු නියාමක ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට මෙහෙයුම් කාලසීමාව ඇතුළත ලංකා විදුලි බල මණ්ඩලය සහතික වී නොතිබුණි.

**(vii)** ලබාගත හැකි වූ තොරතුරු අනුව, සිවිල් වැඩ සඳහා කොන්ත්‍රාත්තු "ටර්න් කී" කොන්ත්‍රාත් ලෙස ප්‍රදානය කර තිබූ අතර 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් පිළිබඳ භෞතික ප්‍රගතිය පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| | **කාර්යය** | | **2014 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය** |
| * | **බලශක්ති කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරිම** | | |
| | - | **පද්ධති පාලන නවීකරණය** | |
| | | ලොට් 01- පද්ධති පාලන මධ්‍යස්ථානය ඉදිකිරීම | ආරම්භක සැලැසුම් වැඩ නිම කිර නැත. |
| | - | ලොට් 02 - සන්නිවේදන පද්ධතිය සවි කිරිම | ප්‍රාථමික කාර්යයන් නිම කර තිබුණි. |
| * | **සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරිම** | | |
| | - | ලොට් ඒ 01 - පාලන ගොඩනැගිල්ල ඉදිකිරිම | ඉදිකිරිම් කාර්යයන් කෙරෙමින් පවතී |
| | - | ලොට් ඒ 02 - අතිරේක කොන්ත්‍රාත්තු | ප්‍රාථමික හා ඉංජිනේරු කාර්යයන් ආරම්භ කර ඇත. |

| | | |
|---|---|---|
| | - ලොට් ඒ 03 - ට්‍රාන්ස්ෆෝමරය සඳහා අත්තිවාරම ඉදිකිරිම | ඉදිකිරිම් කාර්යයන් කෙරෙමින් පවතී. |
| | - පුත්තලම- මාහෝ සම්ප්‍රේෂණ රැහන පිළිබඳ වැඩ විෂය පථය දියුණු කිරිම | ඉදිකිරිම් කාර්යයන් කෙරෙමින් පවතී. |
| * | **බෙදාහැරීම් උපමධ්‍යස්ථාන වර්ධනය කිරිම** | |
| | කටුනායක, නාවල, කිරිබත්ගොඩ, කොටිකාවත්ත හා හික්කඩුව උප මධ්‍යස්ථානවල ධාරිතාවය වර්ධනය කිරීම | විෂය පථය වෙනස් කිරීම හා ලංසු ලියකියවිලි සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් වැඩ 2014 දෙසැම්බර් 31 දින වන විටත් ආරම්භ කර නැත. |
| * | **මහ නගර සහා වීථි ආලෝකකරණය සඳහා ඉල්ලුම් කළමනාකරණය** | භාණ්ඩ ප්‍රසම්පාදනය කර තිබුණි. |
| * | **උපදේශක සේවා** | උපදේශකවරුන් 2014 දෙසැම්බර් 31 දින වන විටත් තෝරා ගෙන නොතිබුණි. |
| * | **දිළිඳු පුද්ගලයන් සඳහා ප්‍රවේශය** | |
| | - නැගෙනහිර පළාතේ සම්ප්‍රේෂණ පද්ධතිය ශක්තිමත් කිරීම | අවශ්‍යා උපකරණ ආනයනය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන තිබුණි. |
| | - ග්‍රාමීය නිවාස සඳහා සම්බන්ධතා | දුෂ්කර ප්‍රදේශවල නිවැසියන් සඳහා ණය 1,334 ක් ප්‍රදානය කර තිබුණි. |

## 3.4. මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 13 | 02 |
| (ii) තෘතියික මට්ටම | 04 | 01 | 03 |
| (iii) ද්විතියික මට්ටම | 111 | 43 | 57 |
| (iv) ප්‍රාථමික මට්ටම | 46 | 45 | 01 |
| (v) වෙනත් (අනියම් / තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | 02 | 13 | - |
| එකතුව | 178 | 115 | 63 |

### (ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු වූ සේවකයන් වෙනුවෙන් පහත විස්තර දක්වා ඇති පරිදි විවිධ ක්ෂේත්‍රයන්ට අයත් 52 ක කාර්ය මණ්ඩලයක් තම කාර්යභාරය ඉටු කිරීම සඳහා වෙනත් බාහිර ආයතනවලින් ලබාගෙන තිබුණි.

| බාහිර පාර්ශවය | සංඛ්‍යාව |
|---|---|
| ලංකා විදුලි බල මණ්ඩලය | 40 |
| සී/ස ලංකා විදුලි (පුද්ගලික) සමාගම | 01 |
| කහවත්ත ප්‍රාථමික විද්‍යාලය | 01 |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 06 |
| තාක්ෂණ පර්යේෂණ හා පරමාණුක බලශක්ති අමාත්‍යාංශය | 03 |
| ජාතික යොවුන් සේනාංකය | 01 |
| **එකතුව** | **52** |